**37. තනතුර අතහැර යාම.**

37 : 1 ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ V වන පරිච්ඡේදයේ විධිවිධානයන් යටතේ සේවය අතහැර යාමේ නිවේදනයක් ලබා සිටින නිලධරයකු එම නිවේදනයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එවැනි අභියාචනයක් සේවය අතහැර යාමේ නිවේදනය නිකුත් කොට මාස තුනක් ගතවීමට පෙර නිසි විනය බලධරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

37 : 2 උක්ත 37 : 1 උප වගන්තිය ප්‍රකාරව විනය බලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් වූ පසු එහි සඳහන් කරුණු අනුව නිලධරයා සේවයට වාර්තා නොකොට ඇත්තේ පිළිගත හැකි හේතූන් මත බව විනය බලධරයාට පැහැදිලි වන්නේ නම් අවසර නොලබා සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් සුදුසු දඬුවම් පනවා නිලධරයා නැවත සේවයේ පිහිටුවීමට නියෝග කිරීමට විනය බලධරයාට බලය ඇත්තේය.

37 : 3 විනය බලධරයා විසින් අදාළ නිලධරයා නැවත සේවයේ පිහිටුවීම ප්‍රතික්ෂේප කොට ඇති අවස්ථාවක දී එම තීරණයට විරුද්ධව අදාළ වන පරිදි අමාත්‍ය මණ්ඩලයට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ එම තීරණය ලබාදුන් දින සිට මාස 06ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදාළ නිලධරයාට හැකියාව ඇත්තේය.

**38. පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කළයුතු ආකාරය.**

මෙම සංග්‍රහයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.